ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

புடவைக் கைத்தொழில் திணைக்களம்

DEPARTMENT OF TEXTILE INDUSTRY

# 2015

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயற்பாட்டு அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் வணிக அமைச்சு

MINISTRY OF INDUSTRY AND COMMERCE

# පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

## 01 හැදින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂ කර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

### 1.1 දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සදහා නිෂ්පාදකයින් යොමු කිරීම.

### 1.2 මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම. එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

## 1.3 අරමුණු

- ➢ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
- ➢ නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම
  - වාවසායකත්ව සංවර්ධන වැඩසටහන්
  - මෝස්තර සම්පාදන වැඩසටහන්
  - පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
- ➢ අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම
- ➢ ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම
- ➢ අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම) අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
- ➢ අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම
- ➢ ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම
- ➢ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදාබැලීම් හා සංරක්ෂණ කටයුතු
- ➢ නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

**i) පර්යේෂණ, පුහුණු,මෝස්තර හා සේවා ආයතනය-කටුබැද්ද**

**(පේෂකර්මාන්ත කෞතුකාගාරය, රසායනාගාරය ඇතුළුව)**

**280/1, ගාලු පාර, කටුබැද්ද, මොරටුව**







**ii) ස්වාභාවික වර්ණ ව්‍යාපෘතිය, රාජගිරිය**

### iii) පේෂකර්මාන්ත පුහුණු පාසැල්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසල් 12 ක් සහ මෝස්තර පුහුණු පාසල් 2 ක් වේ.

| අනු අංකය | ආයතනය | ලිපිනය |
|---|---|---|
| 01 | පෙහෙකම් සිප් පියස, කටුබැද්ද | 280/1,ගාලු පාර, කටුබැද්ද, මොරටුව |
| 02 | පෙහෙකම් සිප් පියස, කොට්ටල | කොට්ටල, වේයන්ගොඩ |
| 03 | පෙහෙකම් සිප් පියස,බෝයගනේ | බෝයගනේ, කුරුණෑගල |
| 04 | පෙහෙකම් සිප් පියස,පින්නවල | පින්නවල, රඹුක්කන |
| 05 | පෙහෙකම් සිප් පියස, වටපුළුව | අරුප්පල පාර, වටපුළුව,මහනුවර |
| 06 | පෙහෙකම් සිප් පියස,ගැටඹේ | ගැටඹේ, පේරාදෙණිය |
| 07 | පෙහෙකම් සිප් පියස,මාතලේ | කෝන්ගහමුල,පලාපත්වල,මාතලේ |
| 08 | පෙහෙකම් සිප් පියස,මාතර | හක්මන පාර, මාතර |
| 09 | පෙහෙකම් සිප් පියස,කිරම | කිරම |
| 10 | පෙහෙකම් සිප් පියස,බණ්ඩාරවෙල | කිණිගම, බණ්ඩාරවෙල |
| 11 | පෙහෙකම් සිප් පියස,නල්ලූර් | 194,පේදුරුතුඩුව පාර,නල්ලූර්,යාපනය |
| 12 | පෙහෙකම් සිප් පියස,සමන්තුරේ | සමන්තුරේ |
| 13 | මෝස්තර පුහුණු පාසල,කටුබැද්ද | 280/1,ගාලු පාර, කටුබැද්ද, මොරටුව |
| 14 | මෝස්තර පුහුණු පාසල,ගැටඹේ | ගැටඹේ, පේරාදෙණිය |










2015/12/31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| <u>මාණ්ඩලික නිලධාරීන්</u> | | | |
| පේෂකර්මාන්ත අධ්‍යක්ෂ | 01 | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | - | 01 |
| ගණකාධිකාරී | 01 | 01 | - |
| පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ | 01 | 01 | - |
| | | | |
| <u>මාණ්ඩලික නොවන නිලධාරීන්</u> | | | |
| පරිපාලන නිලධාරී | 01 | - | 01 |
| කාර්මික නිලධාරී | 01 | 01 | - |
| සංවර්ධන සහකාර | 08 | 08 | - |
| රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය | 20 | 15 | 05 |
| පේෂ උපදේශක | 61 | 56 | 05 |
| නිමහම් සහකාර | 01 | 01 | - |
| චිත්‍ර ප්‍රදර්ශක | 18 | 12 | - |
| | | | |
| <u>කණිෂ්ඨ සේවක</u> | | | |
| රියැදුරු | 05 | 03 | 02 |
| කාර්යාල සේවක සේවය | 10 | 04 | 06 |
| මුරකරු (පුරප්පාඩු සංඛ්‍යාව බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත) | 18 | 05 | 13 |
| සහන මුරකරු | 05 | - | - |
| තාවකාලික මුරකරු | 01 | - | - |
| කම්කරු | 09 | 08 | 01 |
| එකතුව | 163 | 117 | |

නව බඳවා ගැනීම් හා විශ්‍රාම ගැනීම්

2015 වර්ෂය තුළ රාජ්‍ය කළමණාකරණ සහකාර තනතුර සඳහා නව පත්වීම්ලාභීන් දෙදෙනෙකු දෙපාර්තමේන්තුවේ සේවය සඳහා වාර්තා කරන ලද අතර රාජ්‍ය කළමණාකරණ සහකාර තනතුරේ නිලධාරියකු සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

2015 වර්ෂයේදී නිලධාරීන් විශ්‍රාම ගැනීම පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

රාජ්‍ය කළමණාකරණ සහකාර - 01

පේෂ උපදේශක - 04

චිත්‍ර ප්‍රදර්ශක - 01

# 02 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

## 2.1 ප්‍රතිපාදන උපයෝජනය

**2015 වර්ෂයේ සළසා තිබූ ප්‍රතිපාදන පහත පරිදි ප්‍රතිශතයන්ගෙන් උපයෝජනය කර තිබුණි.**

- **මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 95%**

  **මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 58%**

| වැය විෂය | | මුළු ශුද්ධ වෙන් කිරීම (2015 වර්ෂය) (රු:) | මුළු වියදම (රු:) | ශුද්ධ ප්රතිඵලය ඉතිරිය/ඉක්මවීම (රු:) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | |
| **1001** | වැටුප් හා වේතන | 25,600,000 | 24,966,465 | 633,535 | 98% |
| **1002** | අතිකාල හා නිවාඩු දින වැටුප් | 800,000 | 571,624 | 228,376 | 71% |
| **1003** | වෙනත් දීමනා | 30,925,000 | 30,742,766 | 182,234 | 99% |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 14,675,000 | 11,967,887 | 2,707,113 | 82% |
| | | | | | |
| | මූලධන වියදම් | | | | |
| **2001** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,000,000 | 70,930 | 1,929,070 | 4% |
| **2003** | වාහන | 875,000 | 872,163 | 2,837 | 100% |
| **2102** | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 900,000 | 892,756 | 7,244 | 99% |
| **2401** | පුහුණුකිරීම් සහ හැකියා වර්ධනය | 27,725,000 | 16,446,010 | 11,278,990 | 59% |

## 2.2 ආදායම් ගිණුම්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනයක් බැවින් විශේෂ ආදායම් නොමැත.

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කාර්යසාධනය

| | උපරිම හර සීමාව රු: | අවම ලැබීම් සීමාව රු: | උපරිම හර ශේෂ සීමාව රු: |
|---|---|---|---|
| වාර්ෂික විසර්ජන ගිණුමේ සීමාවන් | 5,000,000 | 3,000,000 | 25,000,000 |
| අමාත්‍ය මණ්ඩලය විසින් සංශෝධිත සීමාව(30301) | 5,650,000 | 3,650,000 | 25,000,000 |
| වාර්ෂික සත්‍ය වියදම (30301) | 3,759,047 | 5,860,741 | 11,795,612.91 |

## 3. වාර්ෂික කාර්යසාධනය

3.1 * අනුරාධපුරය, තලාව පේෂකර්මාන්ත පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අළුත්වැඩියාව.
(පේෂකර්මාන්ත පුහුණු පාසලක් හා මෝස්තර පුහුණු පාසලක් ආරම්භ කිරීමට නියමිතය)

* පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කටුබැද්ද අංශයේ පහත සඳහන් අංශයන්හි අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත.

  අධ්‍යක්ෂ නිල නිවස
  ශිෂ්‍ය නේවාසිකාගාරය
  වහලය පිළිසකර කිරීම - ගබඩා අංක 01
  වහලය පිළිසකර කිරීම - ගබඩා අංක 02
  වහලය පිළිසකර කිරීම - ගබඩා අංක 02 (උප කොටස)

* මාලිගාවත්ත, කොළඹ 10හි පිහිටි පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තු නව කාර්යාල ගොඩනැගිල්ලෙහි II වන අදියරේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.

### 3.2 බලවේග අංශය සම්බන්ධ කටයුතු

දෙපාර්තමේන්තුව සතුව තිබී පෞද්ගලික අංශයට විකුණනු ලැබ ඇති බලවේග ආයතන සම්බන්ධයෙන් වන කටයුතු හා එම ආයතනවල සිට රැකියා අහිමි වූ විශ්‍රාම වැටුප් හා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු වේ.

1980/81/82 වර්ෂවල පෞද්ගලීකරණය කරන ලද පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාරවල වසර 10කට අඩු කාලයක් සේවය කළ සේවකයන්ට වන්දි මුදලක් ගෙවීම සඳහා අංක 12/0865515/004-1 හා 2012-07-12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ වන්දි මුදල් ගෙවීමේ කටයුතු අවසන් කර ඇත.

වන්දි මුදල් ගෙවන අවස්ථාව වන විට මියගිය සේවකයන් 57 දෙනෙකුගේ යැපෙන්නන් 176 දෙනෙකු සඳහා අංක අ.ම.ප./1411476/515/023 හා 2014-11-20 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි වන්දි මුදල් ගෙවීමට කටයුතු කර ඇත.

### 3.3 පේෂකර්මාන්ත පුහුණු ව්‍යාපෘති

* පේෂකර්මාන්ත පුහුණු පාසැල් වලට සිසුන් බඳවා ගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසැල් 12 ක් මඟින් පවත්වන පේෂකර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි.

ඒ අනුව 2014/2015 අධ්‍යයන වර්ෂය (2014-07-01 සිට 2015-07-31 දක්වා) සඳහා සිසුන් 180 දෙනෙකු බඳවා ගන්නා ලද අතර 2015/2016 අධ්‍යයන වර්ෂය (2015-07-02 සිට 2016-07-31 දක්වා) සඳහා 2015 ජූලි මස බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 161 කි.

| පේෂ කර්මාන්ත පුහුණු පාසල (පෙහෙකම් සිප් පියස) | අධ්‍යයන වර්ෂය හා බඳවා ගන්නා ලද සිසුන් | |
|---|---|---|
| | 2014/2015 (2014.07.01 - 2015.07.31) | 2015/2016 (2015.07.02 - 2015.07.31) |
| බෝයගනේ | 23 | 28 |
| ගැටඹේ | 17 | 18 |
| වටපුළුව | 10 | 16 |
| පින්නවල | 10 | 12 |
| කටුබැද්ද | 09 | 14 |
| කොට්ටල | 05 | 16 |
| මාතලේ | 05 | 07 |
| මාතර | 15 | 12 |
| කිරම | 13 | 15 |
| බණ්ඩාරවෙල | 17 | 15 |
| සමන්තුරේ | 34 | 04 |
| නල්ලූර් | 22 | 04 |
| එකතුව | 180 | 161 |



* පේෂකර්මාන්ත මෝස්තර පුහුණු පාසැල් වලට සිසුන් බඳවාගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මෝස්තර පුහුණු පාසැල් දෙකකි. 2015 අධ්‍යයන වර්ෂය සඳහා 2015 ජනවාරි මාසයේදී ගැටඹේ මෝස්තර පුහුණු පාසලට සිසුන් 10 ක් හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලට සිසුන් 12 ක් ඇතුළත් විය. දෙපාර්තමේන්තුවේ පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගය සමතුන් මෝස්තර පුහුණු පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලබයි.

4 අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

* අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිල

දේශීය අත්යන්ත්‍ර පේෂකර්මාන්ත නිෂ්පාදකයින් සඳහා වෙළඳපල අවස්ථා උදාකරදීමෙන් ජනතාව අතර අත්යන්ත්‍ර රෙදිපිළි ජනප්‍රිය කිරීමත් ඒ සඳහා වැඩි ඉල්ලුමක් ඇති කිරීමත් අරමුණු කර ගෙන 2015 අප්‍රේල් මස 08-10 දිනයන්හිදී කොළඹ 7 පිහිටි සිංහල සංස්කෘතික ආයතනයේ (සුදර්ශි ශාලාවේ) දී පවත්වන ලදි.

* ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල

අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්රදර්ශනය හා සම්මාන උළෙල 2015 දෙසැම්බර් මස 18 – 20 දිනයන්හි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලා පරිශ්‍රයේදී පවත්වන්නට යෙදින.














DEPT. OF NDUSTRIIES - NORTHERN PROVINCE



## 5 සේවාස්ථ පුහුණු වැඩසටහන

I. පේෂකර්මාන්ත කළමණාකරුවන්, ව්‍යවසායකයින් හා උපදේශකයින් දක්වා විහිදී යන පරිදි පේෂකර්මාන්තයේ වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2015 වර්ෂයේදී පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා පවත්වන ලදි.



පේෂකර්මාන්ත පුහුණු පාසල් සිසුන් සඳහා පෞරුෂ වර්ධන පුහුණු වැඩසටහන



අන්තර් අවකාශ නිර්මාණ පිළිබඳ පුහුණු වැඩසටහන, මාලඹේ (බස්නාහිර පළාත් පේෂ උපදේශක නිලධාරීන් සඳහා)



දික්ජාලා මෝස්තර නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහන, පින්නවල (සබරගමුව පළාත් පේෂ උපදේශක නිලධාරීන් සඳහා)

## 2015 පැවැත්වූ පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය

| අනු අංකය | දිනය | පාඨමාලාවේ නම | ස්ථානය | පැවැත් වූ දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | 2015-01-12/13/14/15/16 | හරස්ජාලා මෝස්තර | වැලිමළුව,සබරගමුව පළාත | 05 | 15 |
| 2. | 2015-02-24/25/26/27 | පල්ලු වියමන් මෝස්තර | ඉබ්බාගමුව,වයඹ පළාත | 04 | 22 |
| 3. | 2015-03-09/10/11/12 | පල්ලු වියමන් මෝස්තර | දියගම,බස්නාහිර පළාත | 04 | 15 |
| 4. | 2015-03-15/19/20 | අගය එකතුකළ භාණ්ඩ | මහර,බස්නාහිර පළාත | 03 | 27 |
| 5. | 2015-05-11/12/13/14 | පල්ලු වියමන් මෝස්තර | අගලවත්ත,බස්නාහිර පළාත | 04 | 21 |
| 6. | 2015-05-19/20/21/22 | දුම්බර රටා මෝස්තර | බෝයගනේ,වයඹ පළාත | 04 | 23 |
| 7. | 2015-05-25/26/27/28 | දුම්බර රටා මෝස්තර | පින්නවල,සබරගමුව පළාත | 04 | 15 |
| 8. | 2015-06-07/08/09 | පේෂපාසැල් සිසුන්ගේ පෞරුෂ වර්ධන වැඩසටහන | කොට්ටල පේෂ පාසල | 03 | 28 |
| 9. | 2015-06/15/16/17 | වර්ණ සංයෝජනය | කටුබැද්ද,මොරටුව | 03 | 26 |
| 10. | 2015-07-08/09/10 | අන්තර් අවකාශ නිර්මාණ | කටුබැද්ද,මොරටුව | 03 | 09 |
| 11. | 2015-07-20/21/22 | ලෙනෝවියමන් මෝසතර | කටුබැද්ද,මොරටුව | 04 | 10 |
| 12. | 2015-07-27/28/29 | ස්වභාවික වර්ණ | කටුබැද්ද,මොරටුව | 03 | 27 |
| 13. | 2015-08-10/11/12 | වෝප් ප්‍රින්ටින් | කටුබැද්ද,මොරටුව | 03 | 21 |
| 14. | 2015-09-07/08/09/10 | පල්ලු වියමන් | කටුබැද්ද,මොරටුව | 04 | 34 |
| 15. | 2015-09-21/22/23 | අගය එකතුකල භාණ්ඩ නිෂ්පාදනය | කටුබැද්ද,මොරටුව | 03 | 11 |
| 16. | 2015-09-28/29/30 ඔක් 01 | දුම්බර රටා මෝස්තර | කටුබැද්ද,මොරටුව | 04 | 12 |
| 17. | 2015-10-05 සිට 16 දක්වා | පෙතැම්පිලි මෝස්තර | කටුබැද්ද,මොරටුව | 10 | 16 |
| 18. | 2015-10-28 සිට 30 දක්වා | දික්ජාලා මෝස්තර | කටුබැද්ද,මොරටුව | 04 | 11 |
| 19. | 2015-11-23 සිට දෙසැ 04 දක්වා | ප්‍රායෝගික විෂය පුහුණුව, | | | |
| 20. | | පේෂ උපදේශක නිලධාරීන් | කටුබැද්ද,මොරටුව | 09 | 03 |
| 21. | 2015-11-16 සිට 19 දක්වා | පල්ලු වියමන් | පින්නවල,සබරගමුව පළාත | 04 | 30 |
| 22. | 2015-11-23 සිට 26 දක්වා | අන්තර් අවකාශ නිර්මාණ | මාලඹේ,බස්නාහිර පළාත | 03 | 21 |
| 23. | 2015-11-11 සිට 20 දක්වා | ඩොබි මෝස්තර | කටුබැද්ද,මොරටුව | 10 | 12 |
| 24. | 2015-12-01 සිට 04 දක්වා | කැච්කාඩ් මෝස්තර | කටුබැද්ද,මොරටුව | 04 | 10 |
| 25. | 2015-12-01 සිට 04 දක්වා | දික්ජාලා මෝස්තර | පින්නවල,සබරගමුව පළාත | 04 | 27 |
| 26. | 2015-12-05 සිට 06 දක්වා | කාර්මිකයින් සවිබල ගැන්විම | කොට්ටල,බස්නාහිර පළාත | 02 | 35 |
| | | | | එකතුව | **481** |

## 6 විභාග පැවැත්වීම

**පේෂකර්මාන්ත පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු**

- පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාග කටයුතු 2015 ජූලි මස 27-29 දිනයන්හි පවත්වන ලදි. මේ සඳහා පේෂ පාසල් සිසුන් 164 දෙනෙකු හා බාහිර අයදුම්කරුවන් 42 දෙනෙකු පෙනී සිටි අතර පේෂ පාසල් සිසුන් තිදෙනෙකු හා බාහිර අපේක්ෂකයින් 05 දෙනෙකු විභාගය සඳහා සහභාගී නොවීය.

| විභාග මධ්‍යස්ථානය | පේෂ පාසල් සිසුන් | | බාහිර අයදුම්කරුවන් | |
|---|---|---|---|---|
| | පැමිණි | නොපැමිණි | පැමිණි | නොපැමිණි |
| කොට්ටල | 10 | - | 01 | - |
| කටුබැද්ද | 12 | - | 06 | - |
| ගැටඹේ | 15 | - | 01 | 01 |
| කිරම | 09 | 01 | - | - |
| බෝයගනේ | 14 | - | 01 | - |
| මාතලේ | 13 | - | 06 | - |
| බණ්ඩාරවෙල | 14 | 01 | 07 | 01 |
| මාතර | 14 | - | - | - |
| වටපුළුව | 15 | - | 02 | - |
| පින්නවල | 11 | - | - | - |
| සමන්තුරේ | 25 | 01 | 11 | 02 |
| නල්ලූර් | 12 | - | 07 | 01 |
| එකතුව | 164 | 03 | 42 | 05 |

- එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2015 ජනවාරි මස බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2016 ජනවාරි මස

  18-20 යන දිනයන්හි පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසුම් කරන ලදි. ඒ සඳහා ගැටඹේ මෝස්තර පුහුණු පාසලේ සිසුන් 08 දෙනෙකු හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලේ සිසුන් 06 දෙනෙකු පෙනී සිටීමට නියමිතය.

<u>දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග</u>

- දෙපාර්තමේන්තුවේ පේෂ උපදේශක තනතුරෙහි සේවය කරන නිලධාරීන් සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග 2015-12-30 වන දින දෙපාර්තමේන්තුවේ කටුබැද්ද අංශයේදී පවත්වන්නට යෙදිනි.

07 වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්තකරලීමේ අරමුණෙන් 2014 වර්ෂයේදී වේයන්ගොඩ, කොට්ටල ග්‍රාමයේ ආරම්භ කරන ලද අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති මධ්‍යස්ථානයේ ප්‍රතිලාභීන් සවි බල ගැන්වීම සඳහා 2015-11-06 වන දින නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය නූල් බෙදා දෙන ලදි.





08 ගම්පහ දිස්ත්‍රික්කයේ සුළු හා ගෘහස්ත කර්මාන්ත දියුණු කිරීමේ වැඩසටහන යටතේ ආරම්භ කළ දිවුලපිටිය, මරදගහමුල අත්යන්ත්‍ර පේෂ ගම්මාන ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සඳහා ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු රෙදිපිළි නිෂ්පාදනය සඳහා අවශ්‍ය නූල් බෙදා දීම **2015-12-07** වන දින සිදු කරන ලදි.

09 පාරම්පරිකව එන කර්මාන්තය රැක ගනිමින් දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනයට දායක වන තලගුණේ , උඩුදුම්බර ප්‍රදේශයේ පදිංචි දුම්බර රටා කර්මාන්තයේ නියැලෙන්නන් 11දෙනෙකු සඳහා අදාළ කර්මාන්තකරුවන් දිරි ගැන්වීමේ අරමුණෙන් අත්යන්ත්‍ර හා උපාංග බෙදාදීම **2015-12-29** දින සිදු කරන ලදි.





10 රජය මඟින් දහම් පාසල් ගුරුවරුන් වෙත නොමිලේ බෙදා දෙනු ලබන දහම් පාසල් සාරි 30,000ක් සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයට අදාළව ලබා දුන් ඇණවුම, පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නිෂ්පාදකයින් මඟින් සම්පූර්ණ කර ලබා දෙන ලදි.

11 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන පේෂකර්මාන්ත පුහුණු පාසල්, ව්‍යාපෘති මධ්‍යස්ථාන හා අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති සඳහා අවශ්‍ය නූල් හා උපකරණ ද ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ උපකරණ ද මිලදී ගන්නා ලදි.

12 ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද මඩකලපුව, පාලමුණේ ප්‍රදේශයේ ස්ථාපිත පේෂකර්මාන්ත පුහුණු, වර්ණ ගැන්වීමේ හා අලෙවි මධ්‍යස්ථානයේ කළමණාකාරීත්වය රත්මලාන, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගලුම් ආයතනය වෙත පැවරීමේ ගිවිසුම 2015-10-28 වන දින පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේදී අත්සන් කරන ලදි.



13 පේෂකර්මාන්ත පුහුණු පාසල්වල පේෂකර්මාන්ත පුහණු පාඨමාලාව හදාරණ සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 2015 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කරන ලදි.

14 2015 වර්ෂයේ ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිල ඇඳුමක් සකස් කරන ලදි.

15 පේෂකර්මාන්ත පුහුණු පාසල්හි ඉගෙනුම ලබන සියළුම සිසුන් සඳහා 2015 වර්ෂයේදීද නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දෙන ලදි.